බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-කොළඹ අධ්‍යාපන කලාපය
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 6 ශ්‍රේණිය<br>Grade 6 | සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍රය<br>Sinhala Language & Literature Paper I & II | පැය දෙකයි<br>*Two hours* |

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.

❖ පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදවලට වඩාත් සමීප අර්ථ දෙන පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. කුඩම්මාගේ කෙණෙහිලිකම් ඉවසාගත නොහැකි වූ දරුවා ගෙදරින් පිට විය.
    (1) හිරිහැර (2) අවවාද (3) සැලකිලි (4) ආදරය

02. අනාදිමත්කාලයක් මුළුල්ලේ ඔවුහු එම ගමෙහි වාසය කළෝ ය.
    (1) ඉතා මෑත කාලයක සිට (2) ඉතා කෙටි කාලයක සිට
    (3) ඉතා ඈත කාලයක සිට (4) ඉතා දීර්ඝ නොවූ කාලයක සිට

❖ පහත සඳහන් වචනවලට සමානාර්ථය දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.

03. පුදුමය - (1) කෝපය (2) මවිතය (3) හාස්‍යය (4) ශෝකය

04. ධවල - (1) සුදු (2) කළු (3) රත්වන් (4) රිදී

❖ පහත සඳහන් වචනවලට විරුද්ධාර්ථ දෙන වචනය පිළිතුරු අතරින් තෝරන්න.

05. උදක - (1) වදක (2) නිරුදක (3) නිදුක (4) විරසක

06. සුලබ - (1) ප්‍රබල (2) බහුල (3) විරල (4) දුලබ

❖ පහත සඳහන් වගන්තිවල යොදා ඇති විරාම ලක්ෂණ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

07. "පියකරු උදයක්" යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.
    (1) තනි උඩු කොමාව සහ තිත (2) යුගල උඩු කොමාව සහ තිත
    (3) තිත් හුල සහ තිත (4) කොමාව සහ තිත

08. අනේ ! ඔහු කොහෙ ගියා ද?
    (1) කොමාව සහ දෙතිත (2) ප්‍රශ්නාර්ථය සහ පෙරළි කොමාව
    (3) විස්මයාදි ලකුණ සහ ප්‍රශ්නාර්ථය (4) ඇල ඉර සහ ප්‍රශ්නාර්ථය

❖ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න.

09. (1) සර්වඥ (2) ශෛලිය (3) අධිෂ්ඨානය (4) ප්‍රතිපලය

10. (1) ස්වබාවික (2) විශිෂ්ටතම (3) පලළ (4) අනිවාර්‍යය

❖ පහත සඳහන් වාක්‍ය දෙකෙහි ඉරි ඇඳි පදවල අර්ථය නිවැරදි ව දැක්වෙන පද වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(අ) වනයට ඇතුළු වූ හිඟන්නාගේ කකුලෙහි විශාල වණයක් විය.
(ආ) එකල කාන්තාවෝ දිය ගෙන ඒමට කළ රැගෙන සැතපුම් ගණන් පයින් ඇවිද ගියෝ ය.

11. වනය - (1. කැලය 2. තුවාලය)

12. වණය - (1. කැලය 2. තුවාලය)

13. කල - (1. කළය 2. කාලයෝ)

14. කළ - (1. කළය 2. කාලයෝ)

◈ පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

15. (කම්කරුවෝ / කම්කරුවන්) ............................................. පාරේ වැඩ නිම කළහ.

16. (තෝ / තොපි) ............................................. කත්ද තරණය කළෙහි.

17. (සභාපතිතුමා / සභාපතිතුමිය) ............................................. සභාව ඇමතුවා ය.

18. ගංගා මුහුදට ගලා ............................................. (බසියි / බසිති.)

19. තළුනිළියෝ රැඟුම් ඉදිරිපත් ............................................. (කළේ ය. / කළෝ ය.)

20. ගුරුතුමා සිසුන් සමඟ අධ්‍යාපන චාරිකාවක් ............................................. (ගියහ. / ගියේ ය.)

(මුළු ලකුණු 2 × 20 = 40)

## II පත්‍රය

◈ 1 සහ 2 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේ දී සිදු කරන ලද ශ්‍රවණ ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   (i) පන්ති කාමරයේ දී ඔබට ශ්‍රවණය කිරීමට ලැබුණු කතාවේ නම කුමක්ද? (ලකුණු 02)
   (ii) එම කතාවේ සඳහන් ප්‍රධාන චරිතය කුමක් ද? (ලකුණු 02)
   (iii) එම කතාවෙන් ලබාදෙන ආදර්ශය කුමක් ද? (ලකුණු 04)
   (iv) ඇගයීම සිදු කිරීමට පෙර ගුරුතුමාගෙන් / ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)
   (v) මෙහි දී ඔබට මතු වූ ගැටලු දෙකක් නම් කරන්න. (ලකුණු 04)
   (මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 125කට නොඅඩු රචනයක් ලියන්න.
   (i) අපේ ජන කවි
   (ii) සුන්දර සන්ධ්‍යාවක්
   (iii) ජල සම්පත රැක ගනිමු.
   (iv) නිරෝගී දිවියකට ක්‍රීඩාව
   (v) ආදි වාසීන්ගේ ජීවන රටාව
   (ලකුණු 14)

03. ඔබ පාසලේ පැවැත් වූ 6 ශ්‍රේණියට ඇතුළත් වූ නවක සිසුන් පිළිගැනීමේ උත්සවය පිළිබඳ ව කරුණු සඳහන් කරමින් වෙනත් පාසලක සිටින මිතුරෙකුට / මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 10)

04. පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න.
   (අ) "කුමක් නිසා උනු ද? පොකුණට බැස පැන් බොව"
      (i) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද? (ලකුණු 01)
      (ii) මෙසේ කීවේ කා හට ද? (ලකුණු 01)
      (iii) මෙසේ කියන ලද්දේ කුමන අවස්ථාවේදී ද? (ලකුණු 02)
      (iv) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න. (ලකුණු 01)
   (ආ) "මේක එක කටකටත් මදිනෝ? මොකද කරන්නෙ?"
      (i) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද? (ලකුණු 01)
      (ii) මෙසේ කීවේ කා හට ද? (ලකුණු 01)

(iii) මෙසේ කියන ලද්දේ කුමන අවස්ථාවේදී ද? (ලකුණු 02)

~~(iv) මෙම ප්‍රසංගය ඇතුළත් පාඩමේ නම ලියන්න.~~ (ලකුණු 01)

(මුළු ලකුණු 10)

05. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපූරු ජීවිත ප්‍රවෘත්ති ඇති මත්ස්‍යයෝ ජලයේ වෙසෙති. ගැහැනු ආඳා ජීවිතයේ වැඩි කොටසක් මිරිදියේ වසයි. පිරිමි ආඳා මුහුද අසල ගංගා දියේ වසයි. බිජුලන කාලය ළං වූ විට මුහුද බලා ගමන් අරඹන ගැහැනු සත්තු බාධක මග හරවාගෙන නිරාහාරව යති. අතරමග දී ඔවුන්ට පිරිමි සත්තු එකතු වෙති. ඔවුන් යන්නේ මුහුදේ නියමිත කොටසකට ම ය. ගැහැනු සතා එහිදී බිජු ලා මිය යයි. පැටවු දෙමව්පියන් සිටි මිරිදිය ජලාශවලට ආපසු පිහිනා එති.

සැමන් මත්ස්‍යයාගේ පිළිවෙළ අනෙක් අතට ය. ඌ ජීවිතයේ වැඩි කාලයක් මුහුදේ ගත කොට බිජු ලෑමට මිරිදිය ජලාශවලට යයි. ගංගා ආදියේ උඩහට නිරාහාර ව යන නොපසුබට උත්සාහය ඇති සැමන් මත්ස්‍යයෝ දිය ඇලි, වැලිතලා, ගල්වැටි ආදි බාධකවලින් පැන ගඟේ බොහෝ දුර ඇතැම් විට සැතපුම් සියයක් පමණ ගොස් ගඟ පතුලේ කුඩා අගලක් හාරා එහි බිජු ලා මැරෙති.

(i) ගැහැනු ආඳා වැඩිපුර වෙසෙන ස්ථානයක් හා පිරිමි ආඳා වැඩිපුර වෙසෙන ස්ථානයක් නම් කරන්න.

(ii) ගැහැනු සැමන් මත්ස්‍යයා බිජුලන්නේ කෙබඳු තැනක ද?

(iii) බිත්තර දැමීමට තැනක් සොයා යන විට මාළුන්ට හමුවන බාධක මොනවා ද?

(iv) ඉහත සඳහන් මාළු දෙවර්ගය ම බිත්තර දැමීමට යන විට ඇති තත්ත්වයන් එක සමාන ය. එය කුමක් ද?

(v) ආඳා පැටවු සහ සැමන් පැටවු යන දෙවර්ගයට ම හිමි පොදු ලක්ෂණය කුමක්ද?

(ලකුණු 2 × 5 = 10)

06. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උදැල්ල හා කැත්ත කරේ තබා ලා
සැහැල්ලුවෙන් බෝම දෙපා නගා ලා
දැකුම්කලුයි දැන් ගොවියා ගමන් ගත්
උදේ සිරීගේ සිරි ඉන් වැඩි වේ

සමන් නෙළුම් හා මහනෙල් ද රෝස
මලින් නැගී ආ සුවඳත් උරා බී
හමන්නෙ මේ සීත සුළං අලුත් වූ
පණක් දිදී මෙන් මට මේ වෙලාවේ

නිකම් ඉඳීමෙන් පල නෑ ගෙ මුල්ලේ
තමන් තමන්ගේ වැඩෙහි යෙදෙත්වා
කියන්නවුන් මෙන් ගන නිල් කැලෑවේ
අඬත් නටත් ගස් අතරේ කුරුල්ලෝ

(i) මෙම කවිවලින් කියැවෙන්නේ කුමක් පිළිබඳව ද?

(ii) මෙහි සඳහන් ආකාරයට උදෑසන අසිරිය වැඩිවන්නේ කුමක් නිසා ද?

(iii) කවියාට නව පණක් ලැබෙනුයේ කුමක් නිසා ද?

(iv) ගස් අතරේ සිටින කුරුල්ලන් අපට දෙන පණිවුඩය කුමක් ද?

(v) මෙම කවි පන්තියේ රචකයා නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

National e-learning Portal for The General Education

07. (අ) පහත සඳහන් කවිවල අඩු පද සඳහා ගැළපෙන පද නිර්මාණය කොට ඒවා සම්පූර්ණ කරන්න.

(i) හෙළ සිරිතට ගරු කරන්න
මනුදම් යහමින් රකින්න
මෙත් කරුණා පතුරවන්න
....................................................... (ලකුණු 01)

(ii) කඳු මුදුනින් හිරු පායා එනවා
ඕලු නෙළුම් මානෙල් හිනැහෙනවා
.......................................................
....................................................... (ලකුණු 02)

(iii) දස මාසයක් මා කුස දැරූ මගෙ අම්මා
.......................................................
.......................................................
....................................................... (ලකුණු 03)

(ආ) සම්පූර්ණ කවියක් නිර්මාණය කොට ලියන්න.
.......................................................
.......................................................
.......................................................
....................................................... (ලකුණු 04)

(ලකුණු 10)

(ලකුණු 60)

✡ **මුස්ලිම් පාසල් සඳහා පමණි.**

◈ පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. "උදය සිරි" කවි පන්තියේ රචකයා කවු ද?
2. "නරි නයිදේ ඊවරිච්චී" පාඩමේ එන චරිත දෙකක් නම් කරන්න.
3. "චිචෙං චූලංගෙං යමු කිරි නැනෝ" පාඩමේ සඳහන් වන්නේ කවුරුන් පිළිබඳ ව ද?
4. "කලා වැව" කාගේ නිර්මාණයක් ද?
5. "අලි උවදුර" පාඩමේ සඳහන් අමුතු සතා කවුරුන් විය හැකි ද? (ලකුණු 2 × 5 = 10)

6. පහත කවිය කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඉර පායන තෙක් නිදනා
අයගේ වැඩ පමා වෙනා
අරුණට පළමුව එයිනා
පිබිදෙනු මැන සෑම දිනා

ඉතා උදය පිබිදීලා
මුව සෝදා දත් මැදලා
හිස පීරාගෙන නිමලා
තම කටයුතු කරනු බලා

(1) වැඩ පමා වන්නේ කාගේ ද? (ලකුණු 02)
(2) සෑම දිනක ම පිබිදිය යුත්තේ කුමකට පළමු ව ද? (ලකුණු 02)
(3) උදෑසන අවදි වී කළ යුතු කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)
(4) සමාන පද කවියෙන් තෝරන්න.
(i) හිරු -
(ii) කට -
(iii) මළව -
(iv) ප්‍රමාද - (ලකුණු 04)

(ලකුණු 10)